# ස්වයං අධ්‍යයනට අත්වැලක්

ශ්‍රේණිය - 6

වාරය - 3 වාරය

නිපුණතා මට්ටම - (6.4 ) විවිධ ජන වර්ග හා සබැඳි සංස්කෘතික උත්සව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම - (6.4.3) නත්තල් උත්සවය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරමු.



සැකසුම :- ටී. යූ ඩී. පීරිස්

මප/වත්/දුම්බර විජය විද්‍යාලය

මෙහෙයවීම :- නර්තන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය

වත්තේගම.

උපදෙස්...............

මෙය ලිඛිත පාඩමකි.මෙම පාඩම වැඩි දුරටත් අධ්‍යයනය සඳහා පාසලේ ගුරු ඇසුර ලබාගත යුතුය.

හැඳින්වීම :- විවිධ ජනවර්ග හා සබැඳි සංස්කෘතික උත්සව පිළිබඳව අධ්‍යයනය කිරීමේදී

- බෞද්ධාගමිකයන්ගේ වෙසක් උත්සවය
- හින්දු ආගමිකයන්ගේ තෛපොංගල් උත්සවය

පිළිබඳ අපි කරුණු උගත්තෙමු.

මෙම පාඩම තුළින් අප බලාපොරොත්තු වන්නේ කිතුනු බැතිමතුන්ගේ "නත්තල් උත්සවය" පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමටයි.

මෙහිදී අප විසින් "නත්තල් උත්සවය",

- පැවැත්වීමේ අරමුණු
- උත්සවය හා සබැඳි ආගමික වත් පිළිවෙත්
- සුවිශේෂී සැරසිලි හා කලාංග
- නත්තල් උත්සවය හා සබැඳි ගුණධර්ම

යන කරුණු පිලිබඳ අවබෝධයක් ලබාගත යුතුය.

# නත්තල් උත්සවය පැවැත්වීමේ අරමුණු

කිතුණු බැතිමතුන්ගේ ගෞරවනීය ශාස්තෘවරයාණන් වූ ද, සාමයේ පණිවිඩය ලොවට ගෙන ආ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වූද,ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත සිදු වූ දෙසැම්බර් මස 25 වන දිනය මුල් කරගෙන කිතු උපත සිහිපත් කිරීම සඳහා කතෝලික බැතිමතුන් නත්තල් උත්සවය සමරයි.

## කිතු උපත

නත්තල යන වචනයේ අර්ථය වන්නේ ද උපත යන්නයි.ජේසුස්



ක්‍රිස්තුස් වහන්සේගේ දෙමාපියන් වූ මරියතුමිය සහ ජුසේතුමා ජීවත්වූයේ නාසරත් නම් නගරයකය.ඔවුන් දෙදෙනා බෙත්ලෙහෙම් නගරයට යන අතරමගදී, ඔවුන් රාත්‍රිය ගත කිරීමට තිබූ තානායම පිරී තිබූ නිසා රාත්‍රිය ගත කළේ සතුන් රඳවා තබා ගන්නා ස්ථානයකයි.

එදින රාත්‍රියේ බෙත්ලෙහෙම් නගරයේ ගවලෙනක ජේසුතුමන් මෙලොව එළිය දුටුවේය. ජේසුතුමන් ඉපදුණු පසු ගව ඔරුවක කුඩා ජේසුස් ළදරුවා තබන ලදී.

## ආගමික වත් පිළිවෙත්

නත්තල් දිනයේ ඉතා අලංකාර ඇදුම් පැළඳුම් වලින් සැරසී දෙව් මැදුර වෙත යන බැතිමතුන්

වන්දනා මාන කිරීම



යාච්ඤා කිරීම





පාප් වහන්සේ ඇතුලු පූජකතුමන්ලා ගේ දේශන වලට සහභාගී වීම.

ජේසුතුමන් පැසසීම.



වැනි වත්පිළිවෙත් සිදුකරයි.

<u>**සුවිශේෂී සැරසිලි හා කලාංග**</u>



නත්තල් ගස



ගවලෙන

# නත්තල් සීයා



සුවිශේෂී ඇඳුමකින් සැරසී කුඩා දරුවන්ට තෑගි බෝග දී සතුටු කරන නත්තල් සීයාගේ චරිතය ආරම්භ කරන ලද්දේ තුර්කියේ විසූ ශාන්ත නිකොලස් පියතුමා විසිනි.

එමෙන්ම විවිධ තූර්ය වාදක කණ්ඩායම් මගින් තුර්ය වාදන සංදර්ශන ද පවත්වනු ලබයි.



# <u>නත්තල් ගීත/කැරොල් ගීත ගායනය</u>



ඉන්දියානු ජාතික ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා විසින් මෙම ගීත සාහිත්‍ය ආරම්භ කරන ලදී.

මෙම ගීත ශ්‍රී ලංකාවේ ආරම්භ කර ඇත්තේ පෘතුගීසි යුගයේ දී ය.

රෑ තරු බබළනවා............ මල් පිපිලා වාගේ............

එළියෙන් නැහැවෙනවා......... මල් වැහැලා වාගේ..........

රැව් පිළි රැව් දෙනවා.......... ගීත නාද වාගේ.................

බිළිදෙකු හිනැහැනවා........... මුහුදක රැළි වාගේ.........

# නත්තල් උත්සවය හා සබැඳි ගුණ ධර්ම

- ජේසුස්තුමාගේ අපේක්ෂා වූයේ පාපයට බරවූ මිනිසුන් ඉන් මුදවා විමුක්ති මාර්ගය පෙන්වා දීමයි.

- නත්තල සැමරීම වශයෙන් සැලකෙන්නේ ක්‍රිස්තියානි දහම ඒ ආකාරයෙන්ම හඳුනාගෙන ඒවා මුලු හදින්ම ක්‍රියාත්මක කිරීමයි.

- මෙදින එකිනෙකාට සුභ පතමින් තැගි බෝග ලබාදී චාරිත්‍ර ඉටු කිරීමෙන්ද කතෝලික බැතිමතුන් ජේසුස්තුමන්ගේ දර්ශනය අර්ථවත් කරයි.

- නත්තල් උත්සවය වූ කලි සාමය,සමඟිය,එකමුතුකම හා කළගුණ සැළකීම යනාදිය තහවුරු කරන සුවිශේෂී අවස්ථාවකි.